# නවීනතම මෝටර් රථ තාක්ෂණ ශිල්පීන් මෙරටට හඳුන්වාදෙන "ජපන් ටෙක්"



නියෝජ්‍ය විදුහල්පති
**ආර්. ඒ. එල් ගලප්පත්ති**

**කාලකට ඉහත දී අප රටේ ජනප්‍රියතම වාහන වූයේ "මයිනර්" "වොක්ස්වැගන්" වැනි වාහනයි. 1977 දී හඳුන්වා දුන් විවෘත ආර්ථිකයත් සමඟ ම මේවා පසෙකට තල්ලු කරමින් "ටොයොටා" "සනී" වැනි මෝටර් රථ මෙරට ජනප්‍රිය වන්නට විය. තනිකරම ජපන් නිෂ්පාදනයන් වන මෙකී වාහන පෙර කී වාහන වලට වඩා බාහිර මෙන්ම අභ්‍යන්තර පෙනුම අතින් ද අලංකාරයෙන් යුක්ත විය. මෙහි ස්වර්ණමය යුගය ආරම්භ වුයේ ඉලෙක්ට්‍රොනික උපාංග සහිත වාහන ආනයනයත් සමඟ ය.**



සමහර මෝටර් රථ කාර්මිකයන් ඇති කළ අස්ථාන බිය නිසා මෙම ඉලෙක්ට්‍රොනික උපාංග සහිත වාහන මිල දී ගැනීමට එකල බොහෝ අය මැලි වූහ. ඉදිරි එළවුම් වාහන (Front Weel) පිළිබඳ ද ඔවුන් දැරුවේ මේ ස්ථාවරය යි. ඇත්ත වශයෙන්ම මෙසේ වාහන හිමියන් බිය ගැන්වුයේ ඔවුන්ට මෙම නවීන වාහන නඩත්තුව ගැන කිසිම දැනුමක් නොතිබූ නිසා ය.

කෙසේ නමුත් නවීන තාක්ෂණයෙන් යුත් වාහන මෙරටට ශීඝ්‍රයෙන් ගලා එන්නට විය. ස්වයංක්‍රීය ගියර, ඉලෙක්ට්‍රොනික් පණ ගැන්වුම් පද්ධති ස්වයංක්‍රීය බ්‍රේක් වැනි අංගයන්ගෙන් සමන්විත වූ මෙම වාහන නඩත්තුව පිළිබඳ දැනුමක් ඇති අය අප රටේ සිටියෙ ද අතලොස්සක් පමණි.

බොහෝ කාර්මිකයන් ස්වෝත්සාහයෙන් එම වාහන නඩත්තුව ගැන ඉගෙන ගත්තත්, ක්‍රමානුකූලව තත්ත්ව පාලනයක් යටතේ වාහන නඩත්තු කිරීම ගැන දැන සිටියේ නැත.

නවීන වාහන නඩත්තු කාර්මිකයන් ගේ ඉල්ලුම වැඩිවත්ම රජයේ අවධානය ද ඒ දෙස යොමු විය. එහි ප්‍රතිඵලය වූයේ ජපානයේ අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සිය කෝටි 50 ක පමණ වියදමක් දරා මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය (ජපන්ටෙක්) ඉදිකර 1989 දී රජයට බාර දීම ය.

ඔරුගොඩවත්ත ප්‍රදේශයේ වගුරු බිමක් ගොඩකර අලංකාර ලෙස ඉදිකළ මෙම ආයතනය දැන් ශ්‍රී ලංකාවේ මෝටර් රථ තාක්ෂණය පිළිබඳ අධ්‍යාපනයක් ලබා දෙන ප්‍රමුඛතම ආයතනය බවට පත්වී ඇත.

නිපුණතා සංවර්ධන, වෘත්තීය හා කාර්මික අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින මෙම ආයතයේ නියෝජ්‍ය විදුහල්පති වන ආර්. ඒ. එල් ගලප්පත්ති මහතා ආයතනයේ අරමුණ අප හමුවේ මෙසේ පැහැදිලි කළේය.


"අප ආයතනයේ මූලික අරමුණ මෝටර් රථ ඉංජිනේරු කර්මාන්තයට අවශ්‍ය දක්ෂ ශිල්පීන් බිහි කිරීම යි. එමෙන්ම දැනට මෝටර් රථ කර්මාන්තයේ යෙදී සිටින අයට අවශ්‍ය තාක්ෂණික විශේෂඥ සේවාවන් සැපයීමත්, ඊට අමතරව නවීන තාක්‍ෂණය හඳුන්වාදීම මඟින් රට තුළ මෝටර් රථ කර්මාන්තය නඟා සිටුවීමත් අපගේ අනෙකුත් පරමාර්ථ අතර වේ.

**පහසුකම්**

"ආයතනයේ පුහුණුව ලබන සිසුන් හට අප ආයතනය මඟින් පහසුකම් රාශියක් සපයා තිබේ උසස් මට්ටමක පුහුණුවක් ලබා දිය හැකි නවීන යන්ත්‍රාගාර හා නවීන ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණවලින් සමන්විත පන්ති කාමරවලින් අප ආයතනය පරිපූර්ණ වී ඇත. එමෙන්ම සියලු පහසුකමින් යුත් පුස්තකාලයක්, මුද්‍රණ අංශයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක් හා ආපන ශාලා පහසුකම්ද අප සතුව ඇත. එමෙන්ම මෙහි ඉගෙනගන්නා සිසුන් හට මාසිකව රු.600/- ක දීමනාවක් ද ගෙවනු ලැබේ.

දැනට පවත්වාගෙන යන පාඨමාලා පිළිබඳ අදහස් දැක්වූ නියෝජ්‍ය විදුහල් පති තුමා,

දැනට මෙහි පාඨමාලා 7 ක් පවත්වයි.



එනම්

1. මෝටර් යාන්ත්‍රික ශිල්පය
2. මෝටර් විදුලි ශිල්පය
3. යන්ත්‍රකරු
4. පින්තාරුකරු
5. ටින්කර් / පෑස්සුම්කරු
6. වාහන වායුසමීකරණ ශිල්පය
7. තොරතුරු තාක්‍ෂණය හා සන්නිවේදන ජාතික තාක්‍ෂණ පාඨමාලාව ආදී වශයෙනි.

**ඇතුළත් වීමට අවශ්‍ය සුදුසුකම්**

වයස අවුරුදු 16 - 25 අතර වූ ගණිතය හා භාෂාව යන විෂයන් ඇතුළුව අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සමත්වීම, මෝටර් යාන්ත්‍රික හෝ විදුලි ශිල්පී හා වායුසමීකරණ පාඨමාලාවන් හැදෑරීමට අවශ්‍ය අවම සුදුසුකම් ලෙස සලකනු ලැබේ.

මෝටර් රථ, පින්තාරු හා ටින්කරින් යන වෘත්තීන් සඳහා 8 වැනි ශ්‍රේණිය සමත්වීම පමණක් සෑහේ. තොරතුරු තාක්‍ෂණ පාඨමාලාන සඳහා අවම සුදුසුකම වනුයේ ඉංග්‍රීසි භාෂාව හා ගණිතය සඳහා සම්මාන සාමාර්ථයන් ලබා අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් සමත්වීම ය.

**පුහුණුව හා සහතික**

මෝටර් යාන්ත්‍රික, විදුලි හා යන්ත්‍රකරු යන පාඨමාලාවන් සඳහා වසර තුනක කාලයක පුහුණුවක් ලබා දේ. මේ වසර තුනෙන් මුල් වසර අප ආයතනය තුළ දීම ප්‍රායෝගික හා න්‍යායික පුහුණුවක් ලබා දේ. ඊළඟ දෑ අවුරුද්ද තුළ සිසුන්ව පිටස්තර ආයතනවලට අනුයුක්ත කරනු ලැබේ. මෙසේ අනුයුක්ත කිරීමෙන් සිසුන්ට පුළුල් ප්‍රායෝගික දැනුමක් ලැබීමට අවස්ථාව සැලසේ. එම දෑ අවුරුද්ද තුළ දී වරින්වර අප ආයතනයට කැඳවා අප ලබා දුන් තාක්‍ෂණ දැනුමත් එම ආයතන තුළ දී ලැබූ දැනුමත් අතර පවතින පරස්පරතා හා ගැටලු පිළිබඳ සාකච්ඡා කෙරේ. ඉන්පසු අවසන් වසරේ අවසන් මාස කීපයේ දී ඔවුන් නැවතත් අප ආයතනයට කැඳවා සම්පූර්ණ පාඨමාලාව නැවත සමාලෝචනය කර අවසන් විභාගයට යොමු කෙරේ.

මෙසේ විභාගයට පෙනී සිට සමත් වූ සිසුන් ඉන් පසු කෙසේවත් අතරමං වන්නේ නැහැ. මක්නිසාද යත්, එම සිසුන්ට විවිධ ආයතනවලින් ඇති අධික ඉල්ලුම නිසායි. බොහෝ සිසුන්ට තමන් කලින් පුහුණුව ලැබූ ආයතනයන් හි රැකියාව කිරීමට අවස්ථාව සැලසේ.

# අර්ධකාලීන පාඨමාලා

| පාඨමාලාව | කාලය | සංඛ්‍යාව |
|---|---|---|
| රියදුරන් සඳහා රිය පැදවීමේ ශිල්ප ක්‍රම | දවස් 02 පැය 16 | 15 |
| මෝටර් යාන්ත්‍රික ශිල්පය 1 කොටස | දවස් 10 පැය 80 | 08 |
| මෝටර් යාන්ත්‍රික ශිල්පය 11 කොටස | දවස් 10 පැය 80 | 08 |
| මෝටර් යාන්ත්‍රික ශිල්පය 111 කොටස | දවස් 10 පැය 80 | 08 |
| ඩීසල් විදුම් පොම්ප සේවා පරීක්ෂාව | දවස් 10පැය 80 | 08 |
| එන්ජින් සුසර කිරීම | දවස් 04 පැය 32 | 08 |
| ස්වයංක්‍රීය ගියර පෙට්ටි නඩත්තුව හා අළුත්වැඩියාව | දවස් 06 පැය 48 | 08 |
| පෙට්‍රල් විද්දුම් පද්ධති පිළිබඳ පුහුණු වැඩ සටහන | දවස් 06 පැය 48 | 08 |
| මෝටර් රථ බැටරි නඩත්තුව | දවස් 02 පැය 16 | 08 |
| මෝටර් රථ විදුලි තාක්ෂණය | දවස් 14 පැය 112 | 08 |
| මෝටර් රථ මූලික ඉලෙක්ට්‍රොනික තාක්ෂණය | දවස් 14 පැය 112 | 08 |
| මෝටර් රථ වායු සමීකරණය | දවස් 10පැය 80 | 08 |
| යන්ත්‍රණය කිරීම - ලියවන පට්ටල් ශිල්පය | දවස් 10පැය 80 | 06 |
| දඟර කඳන් නිමදීම | දවස් 10පැය 80 | 04 |
| සිලින්ඩර් බෝර් කිරීම හා හණ ගෑම | දවස් 10පැය 80 | 06 |
| රත්පිලියම් කිරීම | දවස්02 පැය 16 | 08 |
| යාන්ත්‍රික සැලසුම් ශිල්පී | දවස්10පැය 80 | 08 |
| ඔක්සි / ඇසිටිලීන් වායු පෑස්සුම් ශිල්පය | දවස් 10පැය 80 | 08 |
| විදුලි චාප පෑස්සුම් ශිල්පී | දවස්10පැය 80 | 08 |
| ටිග්4 මිග් පෑස්සුම් ශිල්පී | දවස් 10 පැය 80 | 08 |
| Computer Driving License (CDL) | 12 Days 96 hrs | 15 |
| PC Based Applications | 10 Days 80 hrs | 15 |

අනෙකුත් පාඨමාලාවන් ද මේ ආකාරයට ප්‍රායෝගික පුහුණුව සඳහා බාහිර ආයතනවලට යොමු කර අවසානයේ දී විභාගයට පෙනී සිටීමට සලස්වනු ලැබේ.


මෙම පාඨමාලා අවසන් කරන සියලුම ආධුනිකයන් හට අදාළ ක්ෂේත්‍රය යටතේ නිපුණ කාර්මික ශිල්පී සහතිකය ප්‍රදානය කරනු ලැබේ. ඊට අමතරව ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය මඟින් ජාතික මට්ටමේ ප්‍රවීනතා සහතිකයක් නිකුත් කරනු ලැබේ.

**අර්ධකාලීන සති අන්ත පාඨමාලා**

රැකියාවේ නියුතු අය සඳහා ද ඉහත කී සියලුම පාඨමාලාවන් අර්ධකාලීන පාඨමාලාවන් ලෙස මෙම ආයතන තුළ දී පැවැත්වේ. මෙම අර්ධකාලීන පාඨමාලා සති අන්තයේ සෙනසුරාද හා ඉරිද දිනවල දී පැවැත්වේ. **මෙම පාඨමාලා පිළිබඳ තවදුරටත් අදහස් දැක්වූ එහි අංශ ප්‍රධානී බී.ඩබ්.අමරසිංහ මහතා**

මෙම පාඨමාලාවන් ඉලක්ක කර ඇත්තේ රැකියාවල නියුතු හා මෙම ක්ෂේත්‍රයේ නියුතු එහෙත් වැඩිදුර ඉගෙන ගැනීමට කැමති අය සඳහා යි. මෙහි දී අධ්‍යාපන සුදුසුකම් ලෙස ගැනෙනුයේ සාමාන්‍ය අධ්‍යාපන සුදුසුකම් හෝ පාඨමාලාවට අදාළ කේෂ්ත්‍රයේ නියැලී සිටීම පමණයි. සිංහල භාෂාවෙන් පවත්වනු ලබන මෙම පාඨමාලා සෙනසුරාද දිනවල හා ඉරිද දිනවල පෙ.ව. 8.30 සිට සවස 4.30 දක්වා පැවැත්වේ. එමෙන්ම මෙම පාඨමාලා සඳහා යම් ගාස්තුවක් අය කරනු ලබයි. මෙම අර්ධකාලීන පුහුණුව ලැබීම සඳහා බොහෝ රාජ්‍ය ආයතන හා හමුද අංශ මඟින් තම සේවකයන් යොමු කිරීමේ ප්‍රවණතාවක් දක්නට ඇතැයි ද ඒ මහතා අප සමඟ පැවසී ය.


ආයතන ප්‍රධානීන් කෙසේ කීවත් අධ්‍යාපනය ලබන සිසුන්ට එම පහසුකම් හා අධ්‍යාපනය නිසි ලෙස ලැබේ ද යන්න ගැන අවබෝධයක් ලබා ගැනීමට එම ආයතනය තුළ කළ සංචාරයේ දී අපට හැකිවිය.



## දැනට පවත්වන පූර්ණකාලීන පාඨමාලා

| වෘත්තිය | කාලය | ඇතුළත් කරන ප්‍රමාණය |
|---|---|---|
| මෝටර් යාන්ත්‍රික ශිල්පී | වසර 03 | 85 |
| මෝටර් විදුලි ශිල්පී | වසර 03 | 32 |
| යන්ත්‍රකරු | වසර 03 | 32 |
| මෝටර් රථ පින්තාරුකරු | වසර $1^{1/2}$ | 32 |
| ටින්කර් /පැස්සුම්කරු | වසර $1^{1/2}$ | 32 |
| වායුසමීකරණ ශිල්පී | වසර 02 | 24 |
| තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන | වසර 1 | 20 |







අප මුලින්ම පිවිසියේ මෝටර් රථ යාන්ත්‍රික ශිල්පය උගන්වන අංශයයි. අංශ ප්‍රධානී කේ.ඩබ්.පෙරේරා මහතා එහි දී අපට හමුවිය. මෙම අංශයේ දී සිසුන්ට මෝටර් රථයක බාහිර පෙනුමේ සිට අභ්‍යන්තර කොටස් දක්වා මූලික දැනුමක් ලබාදෙනවා. ඉන්පසු ක්‍රම ක්‍රමයෙන් එහි අභ්‍යන්තර කොටස් පිළිබඳ පූර්ණ දැනුමක් ලබා දී අවසානයේ දී මෝටර් රථයේ සියලුම කොටස් ගලවා නැවත නිවැරදිව සවිකිරීමේ අවස්ථාව ඔවුන් හට ලබා දෙනවා. මෙහිදී කිවයුතු විශේෂිත කරුණක් නම් මේ සඳහා අප ඔවුන්ට ලබා දෙනුයේ අති නවීන මෝටර් රථයි. මෙම මෝටර් රථ සියල්ලම ජපානයෙන් අපට ලැබුන පරිත්‍යාගයන්. අප මේ සිසුන්ට විදුලි කාර්මික ශිල්පය, වායුසමීකරණ ශිල්පය වැනි අනෙකුත් පාඨමාලා ගැනද යම් අවබෝධයකත් ලබා දෙනවා. පුහුණුව ලබන මේ වසර තුන අවසානයේ දී උසස් තාක්ෂණ දැනුමෙන් යුත කාර්මිකයන් පිරිසක් බිහි කිරීම අපේ අරමුණයි.

මෝටර් රථ විදුලි ශිල්පී අංශය ද නවීන උපකරණවලින් සමන්විත වී ඇති බව අපට දැක ගත හැකිවිය. මෙහි ජ්‍යෙෂ්ඨ උපදේශක ජී.එන්.ජයන්ත අප සමඟ පැවසුවේ මෙම පාඨමාලාව අංශ 16 ක් ආවරණය වන පරිදි සකසා ඇති බවයි.

මෙහි ඇති තවත් වැදගත් පාඨමාලාවක් වන්නේ යන්ත්‍රතරු (විශේෂ) පාඨමාලාවයි. ලේත් මැෂිමේ සිට මිලිං ෂේවින්, කැන්ක් ග්‍රයිඩින්, ආදී විවිධ යන්ත්‍ර භාවිතය පිළිබඳ මනා පුහුණුවක් දෙන බව එහි උපදේශක ටී.එස්.ද. සිල්වා අප සමඟ පැවසීය.

වායුසමීකරණ මෙන්ම ටින්කර් පින්තාරු යන පාඨමාලා ප්‍රමිතියක් යටතේ උගන්වන අන්දම අපට දැක ගත හැකිවිය.

මෙහි ඇති විශේෂිත අංශ දෙකක් කෙරෙහි අපගේ අවධානය යොමුවිය. ඉන් එක් අංශයක් වූයේ "පේන්ට් බූත්" (Paint Booth)නම් විශේෂිත කුටීරයයි. විශාල කාමරයක් වැනි වූ මෙතුළ දී ඕනෑම කාලගුණයක් යටතේ වාහන පින්තාරු කිරීමේ පහසුකම් සලසා ඇත. මෙවන් "පේන්ට් බූත්" ශ්‍රී ලංකාවට ම ඇත්තේ කීපයක් පමණක් බව ද දැනගන්නට ලැබිණි. අනෙක නම් "ඩයිනෝ මීටර් " කාමරයයි. ඇන්ජිමක් ගලවා නවීකරණය කළ පසු එහි කාර්යක්ෂමතාව පරීක්ෂා කිරීමේ පහසුකම් මෙය තුළ ඇත. මෙහි ඇති විශේෂිත යන්ත්‍රයට ඇන්ජිම සවිකර අධි පීඩන ජල ධාරාවකට ලක් කිරිමෙන් ඇන්ජිමේ කාර්යක්ෂමතාව මැන ගැනීමට හැකියි. මෙවන් උපකරණයක් ඇත්තේ මෙහි පමණක් බව එහි ජ්‍යෙෂ්ඨ උපදේශක ටී.ජී.විනී අප සමඟ පැවසීය.

පූර්ණකාලීන පාඨමාලා සඳහා අයැදුම්පත් අගෝස්තු මස ගැසට් පත්‍රයේ පළ කරන අතර ලැබෙන අයැදුම්පත් පරීක්ෂාකර ඔක්තෝබර් මස ඔවුන්ව සම්මුඛ පරීක්ෂණයකට කැඳවා ඉන් සමත්වන අය සඳහා නොවැම්බර් මස විභාගයක් පවත්වනු ලැබේ. ඉන් සමත්වන අය සඳහා ජනවාරි මස පන්ති ආරම්භ කෙරේ. අර්ධකාලීන පාඨමාලා සඳහා පුවත්පත් මඟින් දැන්වීම් පළකරන අතර මේ සඳහා අනුගමනය කෙරෙනුයේ සරල ක්‍රියා පටිපාටියකි.



මනා තත්ත්ව පාලනයකින් පවත්වාගෙන යන මෙම මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය සඳහා අයැදුම් කරන්නේ කෙසේද ? අපි නියෝජ්‍ය විදුහල්පති ගලප්පත්ති මහතාගෙන් විමසුවෙමු.

පූර්ණකාලීන පාඨමාලා සඳහා අයැදුම්පත් අගෝස්තු මස ගැසට් පත්‍රයේ පළ කරන අතර ලැබෙන අයැදුම්පත් පරීක්ෂාකර ඔක්තෝබර් මස ඔවුන්ව සම්මුඛ පරීක්ෂණයකට කැඳවා ඉන් සමත්වන අය සඳහා නොවැම්බර් මස විභාගයක් පවත්වනු ලැබේ. ඉන් සමත්වන අය සඳහා ජනවාරි මස පන්ති ආරම්භ කෙරේ.

අර්ධකාලීන පාඨමාලා සඳහා පුවත්පත් මඟින් දැන්වීම් පළකරන අතර මේ සඳහා අනුගමනය කෙරෙනුයේ සරල ක්‍රියා පටිපාටියකි.

පූර්ණකාලීන පාඨමාලා සඳහා අංක 011-2532181 / 011 - 2532182 දුරකතනයෙන් ද අර්ධකාලීන පාඨමාලා අංක 011 - 2572977 යන දුරකතනය ඔස්සේ ද වැඩි විස්තර ලබා ගත හැකිය.

විශේෂ ස්තුතිය
ජ්‍යෙෂ්ඨ උපදේශක සමන් ෆොන්සේකා

- මොහාන්

ඡායාරූප - සංජීව කැල්ලපත